මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: NPD/GSP2022
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2021. 12. 15

චක්‍රලේඛ අංක : MF/NPD 02/2021

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත,

## ගම සමඟ පිළිසඳරක් 2022

වසර 2022 – 2024 මධ්‍ය කාලීන අයවැය රාමුව තුළ අයවැය - 2022 සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ දී, සංවර්ධනයේ ප්‍රතිලාභ කඩිනමින් මහජනතාව වෙත ලබාදීම උදෙසා ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කිරීමට රජය තීරණය කර ඇත.

2022 වර්ෂයේ අයවැය යෝජනා තුලින් ඉදිරිපත් කළ "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 වර්ෂයේ ප්‍රමුඛතම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ලෙස ක්‍රියාත්මක කෙරේ. පවතින කොවිඩ් 19 (Covid 19) වසංගතය තුළින් පැන නැඟුණු කෙටිකාලීන අභියෝග වලට අවධානය යොමු කර, ග්‍රාමීය ජන සමාජයේ බිඳවැටුනු ජීවනෝපායන් නැවත නගා සිටුවමින් ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකයට ජවයක් ලබා දීම මගින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් වේ. එසේම, කිසිදු ප්‍රාදේශීය හෝ සාමාජීය විශමතාවයකින් තොරව ග්‍රාමීය සංවර්ධනයේ ප්‍රතිලාභ සමස්ත ජන සමාජයටම බෙදී යාම සහතික කිරීම අපේක්ෂාවයි.

2022 වර්ෂයේ අයවැය මගින් ක්‍රියාත්මක කරන "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් සිදුකිරීමට මේ වන විටත් උපදෙස් ලබා දී ඇති අතර සමස්ත වැඩසටහන ප්‍රමුඛ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම ඔබගේ අධීක්ෂණය යටතේ සිදුකළ යුතුය.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ හැකි සංවර්ධන අංශ ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ 2021.09.07 දිනැති ලිපිය මගින් මේ වන විටත් ප්‍රාදේශීය ලේකම්වරු වෙත යොමුකර ඇත.

"ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛයේ අඩංගු වේ.

## 1. සංවර්ධන ක්ෂේත්‍ර අනුව ප්‍රතිපාදන වෙන් කිරීම

1.1 ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් කරන ආකාරය පහතින් දක්වා ඇත.

- ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති (ග්‍රාම නිලධාරි වසමකට රු.මිලියන 3) - රු. මිලියන 42,063
- පළාත් පාලන කොට්ඨාස සංවර්ධනය (කොට්ඨාශයකට රු. මිලියන 4) - රු. මිලියන 19,668
- ඉහත වැඩසටහන්වලට අමතරව ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් - රු.මිලියන 19,894
- විමධ්‍යගත අයවැය වැඩසටහන (ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සඳහා රු. මිලියන 15) - රු. මිලියන 3,375

1.2 ඉහත 1.1 හි දැක්වෙන එක් එක් මට්ටම් යටතේ ව්‍යාපෘති තෝරාගැනීමේ දී පහත සඳහන් ක්ෂේත්‍ර ඔස්සේ ග්‍රාම නිලධාරී වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති යෝජනා පෙළගැස්විය යුතුය.

| | | |
|---|---|---|
| ජීවනෝපාය සංවර්ධනය | - | 40% |
| පොදු යටිතල පහසුකම් සංවර්ධනය | - | 40% |
| පරිසර හා තිරසර සංවර්ධනය | - | 10% |
| සමාජ සුභසාධන හා සමාජ සංවර්ධනය | - | 10% |

1.3 සියල්ල එක්ව සැලකූ විට ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් සඳහා අවම වශයෙන් 40% ක් වෙන් කළ යුතු වන අතර උපරිම සීමාවක් නොසලකා ජාතික හා ප්‍රාදේශීය අවශ්‍යතාවය හා නිෂ්පාදන ඵලදායිතාව මත ජීවනෝපාය සංවර්ධනය වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කළ හැකිය.

## 2. සංවර්ධන ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම

### 2.1 ජීවනෝපාය සංවර්ධනය

2.1.1 ජීවනෝපාය සංවර්ධනය සඳහා වෙන් කරන ව්‍යාපෘති මගින් වැඩි පවුල් ප්‍රමාණයකට ප්‍රතිලාභ බෙදී යාම තහවුරු කිරීම සඳහා එක් පවුල් ඒකකයකට ප්‍රතිලාභ කිහිපයක් නොලැබෙන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුය.

2.1.2 ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ජීවනෝපාය සංවර්ධනය සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු මඟින් දැනටමත් සකස් කර ඇති සැලසුම් පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කළ යුතු වේ. හඳුනා ගනු ලබන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන ග්‍රාම නිලධාරි වසමට වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් සපුරා ගත නොහැකි අවස්ථාවල දී, ඉහත 1.1 යටතේ අනෙකුත් අංශ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන තුළින් ලබාගැනීමට කටයුතු කළ හැකිය.

2.1.3 ජීවනෝපාය සංවර්ධනය සඳහා වෙන් කරන ප්‍රතිපාදන හුදෙක් යන්ත්‍ර සූත්‍ර / උපකරණ බෙදා දීම සඳහාම පමණක් වැය නොකර, යම් ක්ෂේත්‍රයකට අදාළව පුළුල් ලෙස අධ්‍යයනය කර

සකස් කරන ලද ප්‍රාදේශීය මෙන්ම ජාතික ආර්ථිකයට අනාගතයේ දී ඵලදායිව දායක වන තිරසර ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යෝජනා සඳහා පමණක් වෙන් කිරීමට වග බලා ගත යුතුය.

2.1.4 ග්‍රාම නිලධාරී වසම තුල ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ තෝරාගන්නා ප්‍රතිලාභීන් සම්බන්ධීකරණය හා තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ වගකීමකි.

2.1.5 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් යටතේ තෝරාගන්නා ප්‍රතිලාභී පවුල් ඒකකයකට වගකියන තාක්ෂණික විෂය ක්ෂේත්‍රයන්ට අදාළ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු විසින් සුදුසු නිලධාරියකු අනිවාර්යයෙන්ම නම් කළ යුතුය.

2.1.6 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කිරීම උදෙසා අදාළ වැඩිදුර උපදෙස් "ඇමුණුම 1" මඟින් දක්වා ඇත.

## 2.2 **පොදු යටිතල පහසුකම් සංවර්ධනය**

2.2.1 නව ඉදි කිරීම්, පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘති, අඩක් නිම කළ ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කිරීමට පෙර එම ඉදිකිරීම් සම්බන්ධයෙන් යෝජිත අරමුණු සඳහා අනාගතයේදී බාධාවකින් තොරව භාවිතයට ගත හැකි බව, නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බව හා තිරසරව පවත්වාගෙන යාමට හැකි ක්‍රමවේදයක් ඇති බවට, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික විය යුතුය.

2.2.2 ගංවතුර, නායයාම් හා නියඟය ඇතුළු ස්වභාවික ව්‍යසන හේතුවෙන් ආපදාවට ලක් වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ව්‍යාපෘති කෙරෙහි ද අවධානය යොමුකළ යුතුය.

2.2.3 ග්‍රාම නිලධාරී වසම තුල පොදු යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය ග්‍රාම නිලධාරී වසමේ ආර්ථික සංවර්ධන නිලධාරීන් විසින් සිදු කළ යුතුය.

2.2.4 පොදු යටිතල පහසුකම් සංවර්ධනය වැඩසටහන් වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කිරීම උදෙසා අදාළ වැඩිදුර උපදෙස් "ඇමුණුම 2" මඟින් දක්වා ඇත.

## 2.3 **පරිසර හා තිරසර සංවර්ධනය**

2.3.1 පරිසර හා තිරසර සංවර්ධනය යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අධිසංවේදී පරිසර කලාප හා ස්වභාවික සම්පත් ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට සියලුම අංශ වග බලා ගත යුතුය.

2.3.2 ග්‍රාම නිලධාරි වසම තුල පරිසර හා තිරසර සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක සියලුම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය ග්‍රාම නිලධාරි වසමේ ආර්ථික සංවර්ධන නිලධාරිගේ වගකීමකි.

## 2.4 සමාජ සුබසාධන හා සමාජ සංවර්ධනය

2.4.1 සමාජ සුබසාධන හා සමාජ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කිරීමට පෙර එම ඉදිකිරීම යෝජිත අරමුණු සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදා ගත හැකි බව, නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බව හා තිරසරව පවත්වාගෙන යාමට හැකි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික විය යුතුය.

2.4.2 ග්‍රාම නිලධාරි වසම තුල සමාජ සුබසාධන හා සමාජ සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක සියලුම සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය ග්‍රාම නිලධාරි වසමේ ආර්ථික සංවර්ධන නිලධාරිගේ වගකීමකි.

2.5 "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධනය වැඩසටහන යටතේ ග්‍රාමීය කමිටු මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සුදුසු ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් පදනම් කරගනිමින් සුදුසු නිර්ණායක සකස් කර ගත යුතුය.

2.6 සියලුම අංශ යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක උපරිම වටිනාකම රුපියල් මිලියන 5කි. විශේෂ වූ අවස්ථාවක දී තෝරාගත් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 5 ඉක්මවන විට දිස්ත්‍රික් ලේකම්වරයාගේ විශේෂ අනුමැතියක් ප්‍රාදේශීය ලේකම් විසින් ලබා ගත යුතුය.

2.7 2022 වර්ෂයේ දී "ගම සමඟ පිළිසඳරක් වැඩසටහන" මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සෘජුව වෙන් කරනු ලබන ප්‍රතිපාදන යොදාගෙන ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ද්විකරණය වීම වැලැක්වීම සඳහා සුදුසු පියවර ගත යුතු අතර ව්‍යාපෘතිවල ශක්‍යතාවය හා ප්‍රාදේශීය සහ ජාතික අවශ්‍යතාව සැලකිල්ලට ගෙන යෝජිත ව්‍යාපෘති සියල්ල ක්‍රියාත්මක කළ හැක.

2.8 ග්‍රාම නිළධාරී වසම් කිහිපයක ජනතාවට වැඩි ප්‍රතිලාභ හිමිවන විභවතාවයක් ඇති අත්‍යාවශ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතියක් (කුඩා පාලම්, අමුණු,වාරි මාර්ග, ආර්ථික මධ්‍යස්ථාන වැනි) ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ග්‍රාමීය කමිටුවල එකඟතාවය ඇතිව ග්‍රාම නිලධාරී වසම් හතරක් (4) දක්වා ප්‍රතිපාදන එක්කර එක් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවිය හැක. මේ සඳහා ඉහත 2.6 හි දක්වා ඇති ක්‍රමවේදය අනුව කටයුතු කළ යුතුය.

2.9 හඳුනා ගන්නා සියලු සංවර්ධන ව්‍යාපෘතීන්හි ශක්‍යතාවය ඇමුණුම 3 අනුව පරීක්ෂා කළ යුතු අතර අවශ්‍ය අවස්තාවල දී අදාල රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ ද නිර්දේශය ලබා ගත යුතුය.

## 3. ව්‍යාපෘති අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම

3.1 ඉහත සියලු කරුණු සැලකිල්ලට ගෙන 2022 වර්ෂයේ "ගම සමග පිළිසඳරක්" වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය ලේකම්වරු විසින් 2022.01.31 දිනට පෙර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය ලබාගෙන දිස්ත්‍රික් ලේකම් වෙත අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. දිස්ත්‍රික් ලේකම් විසින් අදාළ ව්‍යාපෘති අනුමත කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කළ යුතුය.

3.2 අනුමැතිය ලබාගත් දිස්ත්‍රික්කයේ සමස්ත ව්‍යාපෘති යෝජනා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව හා (2022 වර්ෂයේ සියලුම වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනුයේ කාර්තුමය පදනම මත බැවින්) ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට අදාළ කාලය නිවැරදිව තීරණය කර කාර්තු අනුව ප්‍රතිපාදන අවශ්‍යතාව 2022.02.10 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් විසින් ඇමුණුම 4 අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

3.3 සියලුම ව්‍යාපාති යෝජනා වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කර ගෙවීම් ද සිදුකළ හැකි බවට දිස්ත්‍රික් ලේකම්වරුන් හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වගබලා ගත යුතුය.

3.4 මෙම වැඩසටහන මඟින් ආවරණය වන විෂය ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති අයත්වන රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් නිකුත් කර ඇති තාක්ෂණික උපදෙස් වලට හා නිර්නායකයන්ට අනුගත වෙමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.

## 4. වැඩසටහන අධීක්ෂණය

4.1 මෙම සමස්ත වැඩසටහන ජාතික මට්ටමේ දී මුදල් අමාත්‍යාංශය මඟින් ද, දිස්ත්‍රික්ක මට්ටමේ දී දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුව මඟින් ද, ප්‍රාදේශීය මට්ටමේ දී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මඟින් ද අධීක්ෂණය හා මෙහෙයවීම කරනු ලබයි.

4.2 මෙම සමස්ත වැඩසටහන දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ දී දිස්ත්‍රික් ලේකම්වරයාට අධීක්ෂණය හා පසුවිපරම් කිරීමට හැකිවන පරිදි හා අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධීකරණයක් කිරීමට සුදුසු ක්‍රමවේදයක් දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂක විසින් සකස් කළ යුතු අතර, මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කළ යුතුය.

4.3 ග්‍රාම නිලධාරී වසම වෙත වෙන්වන සමස්ත ප්‍රතිපාදනය මඟින් ක්‍රියාත්මක වන ඉහත 1.1 යටතේ ගැනෙන සියලු ව්‍යාපෘතින්ට අදාළ ග්‍රාමීය මට්ටමේ පසු විපරම් හා දත්ත පවත්වාගෙන යාම ග්‍රාම නිලධාරී වසමේ ආර්ථික සංවර්ධන නිලධාරීගේ වගකීමක් වන අතර ඒවායේ ප්‍රගතිය ක්‍රමසම්පාදන නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කළ යුතුය.

## 5. පරිපාලන පිරිවැය

5.1 මෙම වැඩසටහන මඟින් ක්‍රියාත්මක වන ඉදිකිරීම් හා ඉදිකිරීම් නොවන සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් ගේ මුළු ව්‍යාපෘති වටිනාකමින් සත්‍ය වශයෙන් වියදම් කල මුදලින් 3%ක වටිනාකමක් පරිපාලන පිරිවැය වෙනුවෙන් වෙන් කළ හැකිය. සංවර්ධන වැඩසටහන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල පරිපාලන පිරිවැය ද ඊට ඇතුළත් කළ යුතු වේ.

මෙසේ වෙන්වන පරිපාලන පිරිවැය පහත පරිදි වෙන්කර දිය යුතුය.

| | |
|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත | 1% |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත | 2% |

5.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෘජුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර වෙනත් අදාළ රාජ්‍ය ආයතන (උදා: පළාත් පාලන ආයතන, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත වෙන් කරනු ලබන 2% ක පරිපාලන පිරිවැය පහත පරිදි බෙදා වෙන්කළ යුතුය.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත | 1% |
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනයට | 1% |

5.3 වෙන් කරනු ලබන පරිපාලන පිරිවැය මඟින් මෙම සමස්ත වැඩසටහනට අදාළව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කරන රැස්වීම්, සාකච්ඡා, දැනුවත් කිරීම්, ක්ෂේත්‍ර චාරිකා වලට අදාල සියලු වියදම් දැරිය යුතුය.

5.4 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය හා අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් සම්බන්ධ රාජකාරි ඉටු කරන දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් හා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සඳහා ගමන් වියදම්, සංයුක්ත දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා ඉහත වෙන්වන පරිපාලන පිරිවැය භාවිතා කළ යුතුය.

## 6. විගණනය හා වෙනත් කරුණු

6.1 සියලුම ව්‍යාපෘති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, මුදල් රෙගුලාසි හා විවිධ අවස්ථාවලදී රේඛීය අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

6.2 මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයේ විනිවිදභාවය හා ක්‍රියාත්මක ව්‍යාපෘතීන්ගේ ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා සමස්ත වැඩසටහන මනාව විගණනය වන ආකාරයේ ක්‍රමවේදයක් අදාළ වියදම් දරන ආයතන මට්ටමේ දී සකස් කළ යුතුය.

6.3 මෙම වැඩසටහන පිළිබඳව ජනතාවගේ අදහස් ලිඛිත, සමාජ මාධ්‍ය ජාල, විද්‍යුත් තැපැල් ආදී ක්‍රමවේදයන් භාවිතා කරමින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සකස් කළ යුතුය.

6.4 මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම බදු හා අදාළ වෙනත් ගෙවීම් වෙන් කරනු ලබන ප්‍රතිපාදන මඟින් ම ආවරණය කරගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන වෙන් නොකෙරේ.

6.5 මෙම ව්‍යාපෘති හා පළාත් සභා වැඩසටහන් ඉදිරියේ දී ද්විකරණය වීම වැලැක්වීම සඳහා අනුමත සියළුම ව්‍යාපෘති පිළිබඳ විස්තර පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත යොමු කළ යුතුය.

6.6 2022 වර්ෂයේ අයවැය යටතේ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහනට ඇතුලත් විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් වෙනත් චක්‍රලේඛයක් මගින් නිකුත් කරනු ඇත.

එසේම මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳ දිස්ත්‍රික් හා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.ආර්.ආටිගල
ලේකම්

පිටපත් -

1. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු
2. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු
3. ජනාධිපති ලේකම්
4. අග්‍රාමාත්‍ය ලේකම්
5. අමාත්‍ය මණ්ඩල ලේකම්
6. සියළුම අමාත්‍යාංශ ලේකම්වරු
7. සියළුම රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්
8. සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
9. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
11. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
12. අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
13. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
14. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

## අයවැය 2022 - "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධනය වැඩසටහන

## ජාතික ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උපදෙස්

පවතින කොවිඩ් 19 (Covid 19) වසංගතය තුළින් පැන නැඟුණු කෙටි කාලීන අභියෝග වලට අවධානය යොමු කර, ග්‍රාමීය ජන සමාජයේ බිඳවැටුනු ජීවනෝපායන් නැවත නගා සිටුවීම මගින් ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකයට ජවයක් ලබා දීම සඳහා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම ප්‍රමුඛ වේ. මෙම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, කිසිදු ප්‍රාදේශීය, දේශපාලනික හෝ සාමාජීය විෂමතාවයකින් තොරව සමස්ත ජන සමාජයටම ප්‍රතිලාභ හිමිවීම සහතික කිරීම රජයේ අපේක්ෂාවයි.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා වැඩසටහන් මෙන්ම පෞද්ගලික අංශය අතර මනා සම්බන්ධීකරණයක් නොමැති වීම, මහජන මුදල් නිසි පරිදි උපයෝජනය නොවීමට ප්‍රධානතම හේතුසාධකයක් වේ. ව්‍යාපෘති ද්විකරණය වීම, නියමිත යෙදවුම් නිසි කලට නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති වර්ෂ අවසානයේ අතහැර දැමීම, රජයේ සහය අවශ්‍ය සැබෑ ප්‍රතිලාභීන් වෙත නොලැබීම හා සහය හිමිවූ පුද්ගලයින් ඉදිරියටත් එම කාර්යයයේ නියැලෙන බවට ක්‍රමවත් පසුවිපරමක් නොමැතිවීම මෙන්ම නිෂ්පාදන වෙළඳපොළ වෙත යොමු නොවීම නිසා අපේක්ෂිත ජීවනෝපාය සංවර්ධන ඉලක්ක සපුරාගත නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 යටතේ ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සියලු අංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇතිව ක්‍රියාත්මක කිරීම අපේක්ෂාවයි.

### 1. ව්‍යාපෘති හඳුනාගැනීම ඇගයීම හා අනුමත කිරීම

### ව්‍යාපෘති හඳුනාගැනීම

1.1 2022 අයවැය මගින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්වන ප්‍රතිපාදන යටතේ වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීමේ දී ජාතික අවශ්‍යතාව හා ඉලක්ක, යෙදවුම් සීමාවන් (පැල ප්‍රමාණයන්, සතුන්, යන්ත්‍ර-සූත්‍ර, අමුද්‍රව්‍ය, පොහොර, සත්ව ආහාර) පාරිසරික සාධක, දේශීය හා අපනයන වෙළඳපොළ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

1.2 රටේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන **ආනයන ආදේශන නිෂ්පාදන** (වියළි මිරිස්, ලොකු ලූනු, අර්තාපල්, බඩ ඉරිඟු, දියර කිරි) සඳහා බීජ හා පැල නිෂ්පාදනය සහ වගා හා නිෂ්පාදන ප්‍රවර්ධනයට අදාළ ඔබගේ ප්‍රදේශයට ගැලපෙන ව්‍යාපෘති ඇති කිරීමට වැඩි ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුය.

1.3 **වැවිලි බෝග හා අපනයන කෘෂි බෝග වගාවන් හා කවාන් සංවර්ධනයට** මෙන්ම ඒ ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සැකසීම හා ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති සකස් කිරීම සිදු කළ යුතුය.

1.4 ප්‍රාදේශීය සම්පත් විභවතාවයන් හා පුද්ගල නිපුණතාවයන් පිළිබඳවද සැලකිල්ලට ගෙන යම් යම් ප්‍රදේශවල මනා ශක්‍යතාවකින් යුතු **නිෂ්පාදන ගම්මාන** ලෙස එක් එක් බෝග වගාවක්

හෝ වෙනත් නිපුණතා ඒකක ලෙස නව හෝ වැඩිදියුණු කළ හැකි ගම්මාන තෝරා ගැනීම කෙරෙහිද සැළකිල්ලෙන් කටයුතු කළ යුතුය.

1.5 **අපනයනය සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කුළු බඩු, විසිතුරු මල් හා පැල, විසිතුරු මසුන්, මැණික් හා ස්වර්ණාභරණ, අත්කම්** වැනි අංශ ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති සකස් කිරීම සිදු කළ යුතුය.

1.6 වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ශක්තිමත් කරනු පිණිස **හරිත කෘෂිකර්මය** සඳහා පිළිගත් ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයේ **කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘති** දිරිගැන්විය හැක.

1.7 පාරම්පරිකව සිදුකරගෙන යනු ලබන නිෂ්පාදන සඳහා **අගය එකතු කිරීම (value addition)** හරහා නිෂ්පාදකයාගේ ආදායම් ඉහළ නැංවීම මගින් දේශීය හා විදේශ වෙළඳපොළ පුළුල් වන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතුය.

1.8 ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී එම නිෂ්පාදනයන්ට සුදුසු දේශීය හෝ විදේශ වෙළඳපොළ ප්‍රවණතා සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල උපදේශාත්මක සහාය ලබාගැනීම වඩාත් යෝග්‍ය වේ. ඒ සඳහා අදාළ විෂය නිළධාරීන් ග්‍රාමීය කමිටු වෙත කැඳවිය හැක.

1.9 තිරසර ජීවනෝපාය ව්‍යාපෘති හඳුනාගැනීම පිළිබඳ **දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක්** විවිධ මට්ටම් වලින් පැවැත්වීමට මුදල් අමාත්‍යාංශය මගින් කටයුතු කරනු ඇත.

## ඇගයීම හා අනුමත කිරීම

1.10 ඔබ වෙත යොමුකරනු ලබන ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ පූර්ව දැනුවත් කිරීම මත **"ගම සමඟ පිළිසඳරක්"** වැඩසටහන යටතේ මේ වන විට හඳුනාගෙන ඇති ව්‍යාපෘති යෝජනා නැවත සමාලෝචනය කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම්වරු විසින් කඩිනමින් සිදුකළ යුතුය.

1.11 2022 අයවැය හරහා **අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මගින්** ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති හා මේ වනවිටත් විදේශ ණය හෝ ආධාර මත ක්‍රියාත්මක **ව්‍යාපෘති මගින් ආවරණය වන අංශ** (වැඩසටහන්, ප්‍රදේශ, ප්‍රතිලාභීන්ගේ තොරතුරු) පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තොරතුරු **2021.12.31 වන දිනට පෙර** අදාළ අමාත්‍යාංශ මගින් ඔබ වෙත යොමුකරනු ඇති අතර එම තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරු වෙත කඩිනමින් යොමු කළ යුතුය.

1.12 2022 වර්ෂයේ දී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් සඳහාද අවශ්‍ය සම්පත් සැළකිල්ලට ගෙන සම්පත් සුලභතාවය හා ප්‍රාදේශීය මට්ටමින් හඳුනාගන්නා ව්‍යාපෘති සඳහා සැපිරිය හැකි අවශ්‍යතාවයන් (පැල ප්‍රමාණයන්, සතුන්, යන්ත්‍ර-සූත්‍ර, අමුද්‍රව්‍ය, පොහොර, සත්ව ආහාර) **2021.12.31 වන දිනට පෙර** අදාළ අමාත්‍යාංශ මගින් ඔබ වෙත යොමුකරනු ඇති අතර එම තොරතුරු ප්‍රාදේශීය ලේකම්වරු වෙත කඩිනමින් යොමු කළ යුතුය.

1.13 එකම ජීවනෝපාය ව්‍යාපෘතියට "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහනේ විවිධ මට්ටම් යටතේ ප්‍රතිපාදන වෙන් වී ඇති විට **ශක්‍යතාවය හා ප්‍රාදේශීය සහ ජාතික අවශ්‍යතාව සැලකිල්ලට** ගෙන එම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැක.

1.14 අනුමැතිය ලබාගත් ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විෂයයට අයත් ව්‍යාපෘති හා ඒ සඳහා අවශ්‍ය **යෙදවුම් ප්‍රමාණයන් ලබා ගැනීම සඳහා ඉල්ලීම 2022.02.10 දිනට පෙර** අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත යොමුකළ යුතුය.

## 2. ප්‍රතිලාභීන් තෝරා ගැනීම

2.1 තනි පුද්ගල හෝ සමිති වෙත ආධාර ලබා දීමේ දී එක් එක් ප්‍රතිලාභියා වෙත **වාර්ෂිකව ලබා දෙන උපරිම ආධාර ප්‍රමාණය**, ව්‍යාපෘතිය අනුව අදාළ තාක්ෂණික අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව මගින් තීරණය කළ යුතුය.

2.2 ප්‍රතිලාභ ලැබීම සඳහා තෝරාගන්නා ප්‍රතිලාභියා අදාළ ක්ෂේත්‍රයේ සැබෑ ලෙසම නියුතුව සිටින හෝ ඒ සඳහා කැමැත්තක් හා උනන්දුවක් දක්වන විභව ව්‍යවසායකයකු විය යුතුය. එසේ හඳුනාගත් විභව ව්‍යාපෘතිකරුවකුට ප්‍රතිලාභ ලබා දීම සඳහා පවුලේ ආදායම හෝ වෙනත් හේතූන් කිසිසේත්ම බාධාවක් නොවිය යුතුය.

2.3 **වර්ෂයක කාලයක් තුල** මධ්‍යම රජයේ හෝ පළාත් සභා ප්‍රතිපාදන මගින් ව්‍යාපෘතියක් සඳහා ප්‍රමාණවත්, ආදායම් උත්පාදනයට ඍජුව බලපාන ප්‍රතිලාභයන් හෝ සමාන උපකරණ, අමුද්‍රව්‍ය ආදී **ආධාර ලබා දී නොමැති ප්‍රතිලාභීන්** වෙත ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

2.4 ඉල්ලුම්කරුවන් අතරින් හැකි සෑම විටම **තරුණයන්, කාන්තාවන් හා විශේෂ හැකියා ඇති (Differently Abled) පුද්ගලයන් වෙත** විශේෂ අවධානයක් ලබා දිය හැක.

2.5 එක් ප්‍රතිලාභියකු වෙත මූලාශ්‍ර කිහිපයකින් ප්‍රතිලාභ ලැබීමේ අවස්ථා වැළැක්වීම සඳහා, මෙම වැඩසටහන යටතේ හඳුනා ගන්නා ලද සියලුම ව්‍යාපෘති යෝජනා ඇමුණුම 5 හි සඳහන් ආකෘතිය හරහා සම්බන්ධීකරණ නිලධාරියා විසින් ලබාගෙන ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කල යුතුය.

2.6 සියලු මූලාශ්‍රවලට අදාල ව්‍යාපෘති යෝජනා, එක් එක් වසම් හා ව්‍යාපෘති ක්ෂේත්‍ර අනුව කාණ්ඩගත කරන ලද තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය (ඇමුණුම 5 හි තොරතුරු පදනම්ව MS Excel භාවිතයෙන්).

2.7 ජීවනෝපාය සංවර්ධනය හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය ප්‍රතිලාභ ලබා ගැනීමට පෙර ප්‍රතිලාභියා විසින් අදාළ **මූලික කටයුතු** (සුදුසු භූමියක් තෝරාගැනීම, භූමිය සකස් කිරීම ආදී) සිදු කිරීමට එකඟවිය යුතුය.

2.8 විශේෂ තාක්ෂණික හා අධික පිරිවැයක් දැරිය යුතු අවස්ථාවන් හැර ජීවනෝපාය සංවර්ධනය හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘති සඳහා **25% ක අවම ප්‍රතිලාභී දායකත්වයක්වත්** (ශ්‍රමය ද ඇතුලත්ව) ලබා දීම සඳහා දිරිමත් කළයුතුය.

2.9 **හැකි සෑම අවස්ථාවකම** නිෂ්පාදනයන්ට විශේෂ වූ ප්‍රදේශ ආශ්‍රිතව තනි පුද්ගල වැඩසටහන් වෙනුවට නිෂ්පාදන කලාප ලෙස දිරිගැන්වීමට **කණ්ඩායම්/සමිති වෙත සහන ලබා දීමට** කටයුතු කිරීම යෝග්‍ය වේ.

2.10 **ආනයන ආදේශන බෝග හා අපනයන වෙළඳපොළ** ඉලක්ක කරගත් **විශේෂ තාක්ෂණික දැනුම හා කාරක පිරිවැයක් දැරිය යුතු ව්‍යාපෘති** (හරිතාගාර, බීජ සංරක්ෂණ පහසුකම් වැනි) සඳහා සුදුසු ප්‍රදේශවල දැනටමත් ඊට යොමුවී ඇති පුද්ගලයින් මෙන්ම නව ව්‍යාසායකයින් වෙත **100%ක මූල්‍යමය හා තාක්ෂණික ප්‍රතිලාභ** රජය මගින් ලබා දිය හැක.

2.11 එකම ඉඩමක බෝග වර්ග කිහිපයක් වගා කරන අවස්ථාවේ දී පසේ ස්වභාවය, දේශගුණය හා ජාතික නිෂ්පාදන ඉලක්ක අනුව වඩාත් සුදුසු බෝගයකට පමණක් ප්‍රතිලාභ ලබා දීම සිදුකළ යුතුය. එසේ වුවද, වැවිලි බෝග වගාවේදී භූමියෙන් උපරිම ඵලදයිතාවය ලබා ගැනීමට හැකිවන පරිදි මිශ්‍ර බෝග ව්‍යාපෘතියක් වුවද ක්‍රියාත්මක කළ හැකිය.

2.12 ගෙවතු වගා වැඩසටහන්වලදී සියලුම යෙදවුම් එක් වර ලබා නොදී අදියර වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය මත ආයෝජන සහය ලබා දීම සිදුකල යුතු අතර අදාළ තාක්ෂණික නිලධාරීන්ගේ මග පෙන්වීම යටතේ ව්‍යාපෘතියේ සැලසුම පවුල් ඒකක භාර නිලධාරියා විසින් සකස් කල යුතුය.

## 3. ජීවනෝපාය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

3.1 ජීවනෝපාය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු ලබා ගැනීම හා සම්බන්ධීකරණය සඳහා විවිධ විෂයයන්ට අදාළ **සෑම අමාත්‍යාංශයකම හා දෙපාර්තමේන්තුවකම සම්බන්ධීකරණ නිලධාරී ලෙස ජ්‍යෙෂ්ඨ නිලධාරියකු** නම්කර **2021 දෙසැම්බර් මස 31** වන දිනට පෙර මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරනු ඇති අතර එම තොරතුරු ඔබ වෙත යොමු කරනු ඇත.

3.2 ජීවනෝපාය සංවර්ධනය හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය **තාක්ෂණික දැනුම ප්‍රතිලාභීන් වෙත ලබාදීමේ වැඩපිළිවෙලක්** අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සකස් කළ යුතුය.

3.3 එම තාක්ෂණික දැනුම ප්‍රතිලාභීන් වෙත ලබාදීමේ වැඩසටහන් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ දිස්ත්‍රික්කයේ අදාළ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රතිලාභ ලබා දීමට පෙර හෝ අවශ්‍ය අවස්ථාවලදී වැඩසටහන අතරතුර පැවැත්වීමට කටයුතු කළ යුතුය.

3.4 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා රජයට අයත් මේ වන විට ඵලදායීව භාවිතාවට නොගන්නා ගොඩනැගිලි ඇත්නම් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් අදාළ ව්‍යවසායකත්ව සමිති වෙත පමණක් ලබා දිය හැක.

## 4. මධ්‍යගත තොරතුරු පද්ධතිය

4.1 ජීවනෝපාය සංවර්ධනය හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් පුහුණුව, උපකරණ, අමුද්‍රව්‍ය ලබාදෙන ප්‍රතිලාභීන්ගේ සවිස්තර තොරතුරු ඇමුණුම 5 අනුව ඇතුලත් **මධ්‍යම දත්ත පද්ධතියක් මුදල් අමාත්‍යාංශය** මගින් සකස් කර පවත්වාගෙන යාමට නියමිතය. මේ සඳහා අවශ්‍ය තොරතුරු ඔබ වෙත ඉදිරියේ දී ලබා දෙනු ඇත.

4.2 මෙම දත්ත පද්ධතියට අදාළ ප්‍රතිලාභී තොරතුරු (ඇමුණුම 5) ඒ ඒ ප්‍රතිලාභී පවුල් ඒකකයට හෝ සමිතියට වගකියන ක්ෂේත්‍ර නිලධාරියා විසින් ඇතුලත් කළ යුතු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රමසම්පාදන නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ මගින් සහතික කල යුතුය.

4.3 ඉදිරි වර්ෂයන්හිදී ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභ ලබා දීමේ දී මෙම තොරතුරු පද්ධතිය මත පදනම්ව කටයුතු කළ යුතුය.

4.4 එමෙන්ම, මේ වන විට ඔබ දිස්ත්‍රික්කය සඳහා සකස් කෙරෙමින් පවතින **"දිස්ත්‍රික් පෝෂණ හා ආහාර සැලැස්ම"** 2022 වසරේ වැඩසටහන් සහ ඉලක්ක සඳහා ජීවනෝපාය වැඩසටහන් යටතේ ලැබෙන ප්‍රතිපාදන වලින් කෘෂි, වැවිලි, ධීවර හා පශු ආදී ජීවනෝපාය ව්‍යාපෘති වලින් ග්‍රාමීය මට්ටමින් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක ද ඇතුලත් කර ගැනීම ට කටයුතු කළ යුතුය.

## අයවැය 2022 - "ගම සමඟ පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධනය වැඩසටහන

පොදු යටිතල පහසුකම් සංවර්ධනය

1. මාර්ග සංවර්ධනය ව්‍යාපෘති යටතේ හඳුනාගන්නා මාර්ග, කෘෂි මාර්ග, පාලම් හා බෝක්කු සහ පැති බැම් අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර අදාල රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැඩසටහන් මගින් දැනටමත් සංවර්ධනය කිරීම සඳහා තෝරා ගෙන නොමැති බවට තහවුරු කර ගත යුතුය.

2. සෑම ග්‍රාම නිළධාරී වසමකටම එක් වෙළෙඳ නිවසක් (Home Shop) ඇතිකිරීම සඳහා 2022 අයවැය මගින් අවශ්‍ය විශේෂ ප්‍රතිපාදන වෙන් කර දී ඇති අතර ඊට පරිබාහිරව අවශ්‍යතාව මත පමණක් මෙම වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

3. සියළුම ව්‍යාපෘති රාජ්‍ය ආයතනවල පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතුය.

4. ග්‍රාමීය නිවාස යටතේ ප්‍රතිලාභී නිවාස තෝරා ගනීමේදි අඩු ආදායම්ලාභී, දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් තෝරාගත යුතු අතර එම ව්‍යාපෘතියට ප්‍රතිලාභීයාගෙන් අවම වශයෙන් 25% ක (ශ්‍රමයද අතුලත්ව) දායකත්වයක් ලබා දිය යුතුය.

5. ග්‍රාමීය නිවාස ප්‍රතිලාභ සුදුසුකම් ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, නිවාස සංවර්ධන නිලධාරී යන අයගේ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර සුදුසු බවට ලිඛිත තහවුරුවක් ගත යුතුය.

6. අඩක් නිම කළ නිවාස සම්පූර්ණ කිරීමේ ව්‍යාපෘති හා වැසිකිළි උපාංග සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිර්ණායක හා ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

7. අර්ධ වශයෙන් ඉදිකර ඇති සේවා පියස ඒකක වැඩ අවසන් කිරීම හා පහසුකම් සම්පාදනය කල හැකිය.

8. කසල වෙන්කර එකතු කරන මධ්‍යස්ථාන ඉදිකිරීමේදී පාරිසරික සාධක හා සාමාජ ආකල්ප පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

## යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව - 2022

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
02. ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය :
03. යෝජිත ව්‍යාපෘතියේ නම :
04. මෙම වැඩසටහන යටතේ වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන මුදල (රු). :
05. ව්‍යාපෘතියේ ස්වභාවය (√) යොදන්න:

I. සම්පූර්ණයෙන්ම නව ඉදිකිරීමකි ☐
II. නව ඉදිකිරීමකි (එක් කොටසක් වශයෙන්/එක් අදියරක් වශයෙන්) ☐
III. පවතින ව්‍යාපෘතියක කොටසකි ☐
IV. පවතින ව්‍යාපෘතියක අළුත්වැඩියාවකි / ප්‍රතිසංස්කරණයකි ☐

6. ඉහත අනු අංක 5. යටතේ හඳුනාගත් ව්‍යාපෘතිය පිළිබඳ පහත තොරතුරු සපයන්න

6.1. ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම රජයට අයත්ද? ඔව්/නැත
නැති නම් රජයට පවරා දීමට යෝජිත ඉඩම නිරවුල් ද? ඔව්/නැත

ඉඩම නිරවුල් නම්, ඒ සඳහා අදාළ ඉඩමේ හිමිකාරීත්වය විසින් ලිඛිතව
එකඟතාවය ලබා දී තිබේ / එකඟතාවය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත ඔව්/නැත

6.2. අදාළ ඉදිකිරීම සිදුකිරීමට විශේෂයෙන් පහත ආයතනයකින් හෝ ආයතන කිහිපයකින් එකඟතාවය ලබාගැනීම අවශ්‍ය නම්, ඒ බව සඳහන් කරන්න

| අනු. අංකය | ආයතනය | එකඟතාවය ලබාගත යුතු ද නැද්ද යන වග | අදාළ ආයතනයෙන් එකඟතාවය ලබාගත හැකිවේද? |
|---|---|---|---|
| 1 | මධ්‍යම පරිසර අධිකාරිය | ඔව්/නැත | ඔව්/නැත |
| 2 | භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | ඔව්/නැත | ඔව්/නැත |
| 3 | වන සංරක්ෂණ දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 4 | වන ජීවී දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 5 | පළාත් පාලන ආයතනය ( සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |
| 6 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඔව්/නැත | ඔව්/නැත |
| 7 | විදුලිබල මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 8 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 9 | වෙනත් (සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |

7. පසුගිය වර්ෂවල සිදුකළ ආයෝජනයන් පිලිබඳ විස්තර

7.1. ආසන්න වර්ෂ 03 තුළ මෙම ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන් සඳහා
කිසියම් ආයතනයක් මුදල් ආයෝජනය කර තිබේද? ඔව්/නැත

ඔව් නම්, පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කරන්න

| වර්ෂය | මුදල (රු.) | ආයෝජනය කළ ආයතනය | විශේෂ කරුණු (ඇත්නම්) |
|---|---|---|---|
| 2021 | | | |
| 2020 | | | |
| 2019 | | | |

7.2. එසේ නම් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කර තිබේද? ඔව්/ නැත

**8. 2022 මුදල් ආයෝජන පිළිබද විස්තර**

8.1 මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ වෙනත් මූලාශ්‍රයකින් මුදල් වෙන් වී හෝ
වෙන් කිරීමට නියමිතව තිබේද? ඔව්/ නැත

8.2. ඉහත 8.1 යටතේ ඔව් නම් පහත තොරතුරු සපයන්න

| මූලාශ්‍රය | අමාත්‍යාංශය/ ආයතනය | ආවරණය වන වැඩ කොටස | මුදල (රු.) | එමගින් ව්‍යාපෘතිය සම්පූර්ණ කල හැකිද? |
|---|---|---|---|---|
| 1. | | | | ඔව්/නැත |
| 2. | | | | ඔව්/නැත |

8.3. යෝජිත ව්‍යාපෘතිය නිම කිරීමට යෝජනා කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. / ප්‍රමාණවත් නොවේ.

8.4. මෙම ආයෝජන මඟින් ව්‍යාපෘතිය

i. සම්පූර්ණයෙන් නිම වේ /කොටසක් සම්පූර්ණ වේ / තවදුරටත් ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට රු.________________ ක ප්‍රතිපාදන (දළ වශයෙන්) යෙදවිය යුතුය.

8.5. සංවර්ධනය කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය දැනට හොඳ මට්ටමක පවතිද? ඔව්/නැත
ඒ අනුව, යෝජිත ප්‍රතිපාදනය වෙන් කළ යුතු **නොවේ / කල යුතු වේ.**

09. යෝජිත ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වන නිමවුම / ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිලිබඳ විස්තර

i. **මාර්ග ව්‍යාපෘතියක් නම්** අලුතින් වැඩි දියුණු කරන / අලුතින් ඉදි කෙරෙන දුර ප්‍රමාණය - (මීටර්/ කි.මි)................

ii. **කෘෂිකර්ම / වාරිමාර්ග ව්‍යාපෘතියක් නම්** දුර (මී/කි.මි)....... අලුතින් අස්වැද්දෙන බිම් ප්‍ර. (අක්).....

iii. වෙනත් ......................................................................................................

iv. ප්‍රතිලාභීන් සංඛ්‍යාව - පවුල්:--------- පුද්ගල - (ස්ත්‍රී):- --------- (පුරුෂ):- ---------

10. ව්‍යාපෘතිය මඟින් ග්‍රාමීය ප්‍රජාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභ සඳහන් කරන්න

i.

ii.

iii.

11. ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රජා අවශ්‍යතා අතර මෙම ව්‍යාපෘතිය, <u>අත්‍යාවශ්‍යයි/ අවශ්‍යයි/ ප්‍රමුඛ නැත/ අවශ්‍ය</u> නැත

12. 2022 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ හැකිද? හැකිය/නොහැකිය

13. ඔව් නම් ඒ සඳහා ගත විය හැකි කාලය: - .............. සිට .................. දක්වා මාස / සති ...............................

14. ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු

14.1. නිමවූ පසු නඩත්තුව බාරවන ආයතනය - ...................................... ....................................... ...........

14.2 නිමවූ පසු නඩත්තු වැඩ පිළිවලක් තිබේද ? විස්තර දක්වන්න - ........................................ ......................
...................................... ...................... ...................................... ..................... ..............................

15. මෙම ව්‍යාපෘතිය පිළිබඳව ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී.

ඉහත තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

............................ දිනය:-
සංවර්ධන නිළධාරී,
ග්‍රාම නිළධාරී වසම (නම හා අංකය)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට <u>නිර්දේශ කරමි</u>.

.................................. දිනය:-
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට සහතික කරමි.

......................... දිනය:-
ප්‍රාදේශීය ලේකම්
(මුද්‍රාව)

## "ගම සමඟ පිළිසඳරක් 2022" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

දිස්ත්‍රික්කය :...........................................

| ප්‍රධාන ක්‍රියාකාරකම | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. (මිලියන) | මූල්‍ය ඉලක්ක 2022 (රු. මිලියන) | | | | 2022 සඳහා භෞතික ඉලක්ක % | | | | ප්‍රතිලාභී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | කාර්තු 1 | කාර්තු 2 | කාර්තු 3 | කාර්තු 4 | කාර්තු 1 | කාර්තු 2 | කාර්තු 3 | කාර්තු 4 | |
| ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | | | | | | | | | | | |
| පළාත් පාලන කොට්ඨාස සංවර්ධනය | | | | | | | | | | | |
| ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

පරීක්ෂා කළේ

සහතික කළේ

සකස් කළේ : ................................

.................................. දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ

.................................. ප්‍රධාන ගණකාධිකාරී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

.................................. දිස්ත්‍රික් ලේකම්

දිනය : ..................................

මුද්‍රාව

මුද්‍රාව

මුද්‍රාව

# අයවැය 2022 -ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන
# ජාතික ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
# ප්‍රතිලාභී තොරතුරු පත්‍රය

1. දිස්ත්‍රික්කය

2. ප්‍රාදේශීය ලේ.කොට්ඨාශය

3. ග්‍රාම නිලධාරී වසම හා අංකය

**තනි පුද්ගල ව්‍යාපෘති**

| 4. ප්‍රතිලාභියාගේ නම | 5. ජා.හැ.අංකය | 6. දුරකථන අංකය | 7. රැකියාව/ජීවනෝපාය |
|---|---|---|---|
| | | | |

8. ලිපිනය:..........................................................................................................

පවුලේ සාමාජිකයින්ගේ:

| නම | ජා.හැ.අංකය | දුරකථන අංකය | රැකියාව/ජීවනෝපාය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

9. පවුල් ඒකකයේ මාසික අදායම: ...................................................

10. යෝජිත ව්‍යාපෘතිය: ..........................................................................................................

11. යෝජිත වටිනාකම (රජයේ දායකත්වය)* රු. : ...................................

| අංශය | 11.1 | ප්‍රතිලාභී දායකත්වය (ශ්‍රමය ඇතුළුව)රු. | රජයේ දායකත්වය | | මුළු ව්‍යාපෘති වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| | | | රු.* | යෙදවුම් (11.2) | |
| ධීවර | | | | | |
| කෘෂි | | | | | |
| පශු සම්පත් | | | | | |
| වැවිලි | | | | | |
| ව්‍යවසාය සංවර්ධන | | | | | |
| සංචාරක | | | | | |
| අලෙවි සංවර්ධන | | | | | |
| නිෂ්පාදන කර්මාන්ත හා සේවා | | | | | |
| ගෘහ කර්මාන්ත | | | | | |

**සමූහ ව්‍යාපෘති**

12. සමිතියේ නම :............................................... ...............................................................

13. ලියාපදිංචි අංකය/වර්ෂය :...........................................

14. සාමාජිකයන් සංඛ්‍යාව :.......................

15. යෝජිත ව්‍යාපෘතිය :..........................................................................................................

16. යෝජිත වටිනාකම (රජයේ දායකත්වය)* රු. : ..................................

| අංශය | 16.1 | ප්‍රතිලාභි දායකත්වය (ශ්‍රමය ඇතුළුව)රු. | රජයේ දායකත්වය | | මුළු ව්‍යාපෘති වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| | | | රු.* | යෙදවුම් (16.2) | |
| ධීවර | | | | | |
| කෘෂි | | | | | |
| පශු සම්පත් | | | | | |
| වැවිලි | | | | | |
| ව්‍යවසාය සංවර්ධන | | | | | |
| සංචාරක | | | | | |
| අලෙවි සංවර්ධන | | | | | |
| නිෂ්පාදන කර්මාන්ත හා සේවා | | | | | |
| ගෘහ කර්මාන්ත | | | | | |

මාගේ / අප* සමිතියේ ජීවනෝපාය කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා වර්ෂයක කාලය තුල රජයෙන් ආධාර ලබාගෙන **ඇති/නොමැති*** බවත්, මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකමින් ...........% ප්‍රතිලාභි දායකත්වයක් දැරීමටත්, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු කරන බවටත්, ලැබෙන ආධාර නිවැරදි ලෙස භාවිතා කරන බවටත් සහතික වෙමි.

............................................................

දිනය: ප්‍රතිලාභියාගේ/සමිතියේ සභාපති/ලේකම්*අත්සන

**සමෘද්ධි සංවර්ධන නිලධාරී,**

මෙම ඉල්ලුම්කරු/සමිතිය* මෙම ප්‍රතිලාභයට සුදුසු/නුසුදුසු* බවත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පසුගිය වර්ෂයක කාලය තුල රජයෙන් ආධාර ලබා ගෙන ඇති/නොමැති* බව සහතික කරමි.

| 17 නම- | 18 දුරකථන අංකය | අත්සන |
|---|---|---|
| | | |

**ජීවනෝපාය සංවර්ධන තාක්ෂණ නිළධාරී** (ප්‍රාදේශීය මට්ටම),

19. ආයතනය .............................................................

20. තනතුර .............................................................

මෙම ඉල්ලුම්කරු/සමිතිය* මෙම ප්‍රතිලාභයට සුදුසු/නුසුදුසු* බව නිර්දේශ කරමි.

| 21 නම- | 22 දුරකථන අංකය | අත්සන |
|---|---|---|
| | | |

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු* බවට නිර්දේශ කරමි.

.................................. දිනය:-

**නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)** (මුද්‍රාව)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු / නුසුදුසු* බවට සහතික කරමි.

......................... දිනය:-

**ප්‍රාදේශීය ලේකම්**

(මුද්‍රාව)

*අනවශ්‍ය වචන කපාහරින්න